# වාද්දුව ශුද්ධාත්ම දෙව්මැදුර පිළිබඳ පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

එස්.එන්.සී. පෙරේරා

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nirodhachandramali1@gmail.com

**මුඛ්‍ය පද** - ශ්‍රී ලංකාවේ කතෝලික දහම, වාද්දුව ස්ප්‍රීතු සාන්තු දේවස්ථානය, කතෝලික වාස්තුවිද්‍යාව, කතෝලික සිතුවම් කලාව

## හැඳින්වීම

කළුතර දිස්ත්‍රික්කයේ ඇති පැරණි දේවස්ථාන අතුරින් වාද්දුව ස්ප්‍රීතු සාන්තු දේවස්ථානයට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. ඓතිහාසික මූලාශ්‍රවලට අනුව වාද්දුව ප්‍රදේශයේ කතෝලික ඉතිහාසයේ මූලාරම්භය 17 වැනි සියවස තරම් අතීතයක් විහිදී යන අතර වාද්දුව ගොඩ කැලේ දෙහිගහවත්ත ප්‍රදේශයෙහි කටු මැටි ගෙයක පොල් අතු සෙවිලි කර ඉදිකරන ලද කුඩා දෙව් මැදුර මෙම ප්‍රදේශයෙහි පැරණි දේවස්ථාන ගොඩනැගිල්ලයි. අනතුරුව ලන්දේසි පාලන සමයේ දී ඔවුන් විසින් කතෝලිකයන් සහ කතෝලික දේවස්ථානය කෙරෙහි එල්ල කරන ලද මර්ධනකාරී ක්‍රියා පිළිවෙත අනුව වාද්දුව ප්‍රදේශයේ තිබූ එම කතෝලික දේවස්ථානය ද විනාශයට පත් කර ඇති අතර ඒ වෙනුවට රෙපරමාදු ක්‍රිස්තියානි දේවස්ථානය ඉදිකර තිබේ. එහෙත් එම කතෝලික දේවස්ථාන තිබූ දේවමාතා ප්‍රතිමාව කතෝලික ජනතාව විසින් සඟවා ගෙන ආරක්ෂා කරන ලද බව ජනප්‍රවාදයෙහි සඳහන් වේ (ප්‍රනාන්දු, 2008:2-3). අනතුරුව ක්‍රිස්තු වර්ෂ 1800 දී පමණ බ්‍රිතාන්‍ය පාලන සමය තුළ දී වාද්දුව වේරගම පාර කිරිඇල්ල ගහවත්ත ඉඩමෙහි තාවකාලික දෙව් මැදුරක් ඉදිකර ඉහත සඳහන් කළ දේවමාතා ප්‍රතිමාව එහි තැන්පත් කොට වන්දනාමාන කටයුතු සිදුකරන ලද බව ජනප්‍රවාදයේ සඳහන් වේ. 1818 දී එම තාවකාලික දෙව්මැදුර වෙනුවට නව දෙව්මැදුරක් ඉදිකර ඇති අතර එය ශාන්ත මරියා දෙව් මැදුර නමින් හඳුන්වා ඇති බව සඳහන් වේ. අනතුරුව ක්‍රිස්තු වර්ෂය 1883 දී දේවමාතාවන්ට කැප කර තිබූ එම කුඩා දෙව් මැදුර තුළ මුල්වරට ස්ප්‍රීතු සාන්තු වහන්සේට මංගල්‍යය කරවා ඇති අතර එතැන් පටන් මෙම දේවස්ථානය ශුද්ධාත්ම දෙව්මැදුර නමින් හැඳින්විණි. වර්තමානයේ දක්නට ලැබෙන දෙව්මැදුර පසුකාලීනව නවීකරණයකට ලක් කොට ඇති අතර එහි මුල් ඉදිකිරීම සිදුකොට ඇත්තේ 1887 දීය (ප්‍රනාන්දු, 2008:8). ඒ අනුව ශුද්ධාත්ම දෙව්මැදුර ලෙස වසර 136ක ඉතිහාසයක් සනිටුහන් කරන මෙම දෙව් මැදුර හා ඒ ආශ්‍රිත පරිශ්‍රයේ පුරාකෘති පිළිබඳව විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ පරමාර්ථය වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයන පාදක කරගන්නා අතර සෙසු ඓතිහාසික තොරතුරු සඳහා සාහිත්‍ය මූලාශ්‍රය පරිහරණය හා සම්මුඛ සාකච්ඡා ද උපයෝගී කරගන්නා ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

යටත්විජිත පාලන සමය තුළ දී ඉදිවූ ලක්දිව වාස්තු විද්‍යාත්මක ව්‍යුහයන් අතර දේවස්ථාන ඉදිකිරීම ප්‍රධාන වේ. දේවස්ථානය යනු කතෝලිකයින් තම නමස්කාරය සඳහා නිර්මාණය කරන ලද ගොඩනැගිල්ලකි. එසේ ම මෙම දේවස්ථාන ගොඩනැගිලි ලක්දිව ඉදිකිරීම් ක්ෂේත්‍රයට එක් වූ විදේශීය ගොඩනැගිලි සම්ප්‍රදායක් හෙයින් මේ සඳහා යුරෝපීය දේවස්ථාන ඉදිකිරීම් සම්ප්‍රදාය හඳුනාගැනීම වැදගත් වේ. යුරෝපීය දේවස්ථාන වාස්තුවිද්‍යාව ප්‍රධාන ඉදිකිරීම් ව්‍යුහයක් වන බයිසැන්තියන්, රෝමේනස්ක්, ගොතික්, බැරොක් වැනි ශිල්ප විවිධ අවධීන් තුළින් හඳුනාගත හැකිය. මෙම සම්ප්‍රදායන් අතරින් ලක්දිව ඇති දේවස්ථාන

බොහෝමයක් ගොතික් හා රෝමේනස්ක් යන වාස්තුවිද්‍යාත්මක ශිල්ප ක්‍රම යටතේ ඉදි කර ඇති බව හඳුනාගත හැක. ඒ අනුව වාද්දුව ස්ප්‍රීතු සාන්තු දේවස්ථානය රෝමේනස්ක් යන වාස්තුවිද්‍යාත්මක ශිල්ප ක්‍රම යටතේ රෝමානු ගොඩනැගිලි ලක්‍ෂණවලින් සකස් ව ඇති බව හඳුනාගනියි. මෙය රෝමානු ක්‍රමයේ දේවස්ථානයක ඇති ප්‍රධාන ලක්‍ෂණ වන බොකු වහල හා රවුම් ආරුක්කුව සහිත ප්‍රධාන දොරටුවට ඉහළින් රවුම් කවුළුවක් තිබේ. එය රෝස ජනේලය නමින් හැඳින්වේ. ඊට අමතරව කුරුස හැඩයේ බිම් සැලැස්මකට (Crusiform) අනුව නිර්මාණය කොට ඇති මෙම දේවස්ථානයේ මොගොප්පුව (facade) යුරෝපීය වාස්තුවිද්‍යාවට අනුගතව විසිතුරු ලෙස නිර්මාණය කර තිබේ. දෙපස සිව්රැස් කුලුනු දෙකක් සහිත එය මහල් දෙකකට නිර්මාණය කර තිබේ. දෙපස සිව්රැස් කුලුනු දෙකක් සහිත එය මහල් දෙකකට නිර්මාණය කර තිබේ (ඵලක 01). දොරටු හා කවුළු (Niches) ආරුක්කු හැඩයට නිමවා ඇති අතර එම දොරටු දෙපස කොටස්වලට (Side aisles) හා මැද කොටසට (Nave) පිවිසිය හැකි පරිදී වේ. මෙහි පූජාසනය සහිත සභාවේ (Prestytery) පිටුපස කොටස (Apse) සිටින බිත්තිය කවාකාර වන පරිදී තනා තිබේ (ඵලක 02). ප්‍රධාන ද්වාරයට ඉහළින් වූ ගේබල් බිත්තිය සහිත කොටස මධ්‍යයේ වූ කවුළුවෙහි (Nich) මරියතුමියගේ ප්‍රතිමාවකි. මෙම දේවස්ථානයේ ව්‍යුහාත්මක අංග අතර පූජාසනය, අන්තරාලය, කුලුනු, හැඩය, හරස් හැඩය, කාර්ටෙක්ස් ආලින්දය, චාන්සලය යන අංගයන්ගෙන් නිර්මිත ය. ඒ අතරින් පූජාසනය ප්‍රමුඛ සාධකයක් ලෙස පෙන්වාදිය හැක.



ඵලක 01 - දේවස්ථානය ඉදිරිපිට



ඵලක 02 - දේවස්ථානය අභ්‍යන්තරය

තවද වසර 175ට වඩා පැරණි ගල් කුරුසයක් මෙන් ම වසර සියයකට වැඩි සොහොන් කිහිපයක් ද මෙම දේවස්ථාන පරිශ්‍රයෙහි දැකගත හැක (ප්‍රනාන්දු, 2008:10). ඒ අතරින් දේවස්ථානය ඉදිරිපිට තනා ඇති සොහොන් කළුගලින් නිර්මිත වන අතර මෙය ක්‍රි.ව. 1892 කාලයට අයත් බව එහි සඳහන් කොට තිබේ. (ඵලක 03) තවද එය දේවස්ථානයේ ප්‍රථම අන්නවි රාළ වන හේවාපොන්සේකාගේ අන්තෝනි පොන්සේකාගේ දේහය එහි තැන්පත් කොට තිබේ. ඊට අමතරව ක්‍රි.ව. 1914ට අයත් අන්ද්‍රිස් කුරේ නැමැත්තකුගේ සොහොනක් ද එම දේවස්ථා න භූමිය තු ළ පිහිටි සොහොන් (ඵලක 04) අතරෙහි දැකගත හැකිය.



ඵලක 03 සොහොන



ඵලක 04 සොහොන

පසුකාලීනව දෙව්මැදුරේ දැනට දක්නට ලැබෙන සිතුවම් නිර්මාණය කොට ඇත්තේ 1983 වර්ෂයේ දීය. මෙම සිතුවම් නිර්මාණය කර ඇත්තේ, කේ. හර්මන් ජෝසෆ් සිල්වා නැමැති ශිල්පියා විසිනි (සිල්වා, 2010:56). සිතුවම් ද්විත්වයෙන් ප්‍රධාන සිතුවම ස්පීතු සාන්තු වහන්සේගේ වැඩම වීමක් දැක්වෙන සිතුවමකි. තාත්වික ශෛලියට නිමවා ඇති මෙම සිතුවම් ද්විත්වයෙන් පළමු සිතුවම කලාත්මක බවින් විශිෂ්ට ලක්ෂණ පෙන්වයි. දෙවන සිතුවම පළමු සිතුවම පරිද්දෙන් වර්ණ සංයෝජනයකින් සමන්විත නොවූව ද ඉතා තාත්වික ලෙස භාව ප්‍රකාශ පිළිබිඹු වන අයුරින් නිර්මාණය කර ඇති බවක් දැකගත හැකිය. ශ්‍රී ලංකාවේ බිතු සිතුවම් පිළිබඳව අධ්‍යනය කිරීමේ දී කිතුනු සිතුවම් කලාව සඳහා යොමු වී ඇත්තේ සාපේක්ෂ වශයෙන් අඩු අවධානයක් බැවින් මෙම අධ්‍යයනය එම සිතුවම් සම්ප්‍රදාය හැදෑරීම සඳහා ප්‍රවේශයක් ලෙස පෙන්වා දිය හැකිය.

19 වන සියවස අගභාගයේ දී බිහි වූ කතෝලික දේවස්ථානයක් ලෙස වාද්දුව ස්ප්‍රීතු සාන්තු දෙව්මැදුර කළුතර දිස්ත්‍රික්කයේ දේවස්ථාන අතර සුවිශේෂී වැදගත්කමක් උසුලයි. යුරෝපීය වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ අනුව නිර්මිත මෙම දේවස්ථානය ඇසුරෙන්, ග්‍රීක රෝම සම්මිශ්‍රිත වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ ද මනාව විද්‍යමාන කරයි. ඒත් සමඟ ම කතෝලික කලා සම්ප්‍රදාය මනාව පිලිබිඹු කරන සිතුවම් හා ප්‍රතිමාවලින් ද මෙම දේවස්ථානය ද සමන්විත වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ප්‍රනාන්දු.,ඩී, එම්, 2008, ***වාද්දුව ශුද්ධාත්ම දෙව්මැදුර 125 වන ජුබිලිය සමරන වගයි***, වාද්දුවඃ ශුද්ධාත්ම දෙව්මැදුර.

සිල්වා., එල්, එච්, 2010, ***ලාංකේය කතෝලික දෙව්මැදුරු බිතු සිතුවම් කලාව***, කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.